# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2253/62 - 2021 නොවැම්බර් මස 13 වැනි සෙනසුරාදා - 2021.11.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**නඩු අංකය : A/08/2017**

*මගේ අංකය* : IR/COM/04/E/2015/189.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.01.30 දිනැති හා අංක 2004/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.12.05 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නුගේගොඩ, ඇඹුල්දෙනිය, මාදිවෙල පාර, අංක 20ඒ හි පදිංචි ජේ. එස්. ඩබ්ලිව්. බුලත්සිංහල මයා සහ කොළඹ 03, එඩ්වඩ් පටුමඟ, අංක 35 හි පිහිටි පර්ෂිප් සිනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.10.11 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*යොමු අංකය* : IR/COM/04/E/2015/189.

කාර්මික අධිකරණයේ දී ය.

නඩු අංකය : A/08/2017

1. ජේ. එස්. ඩබ්ලිව්. බුලත්සිංහල මහතා,
අංක. 20 ඒ, මාදිවෙල පාර,
ඇඹුල්දෙනිය,
නුගේගොඩ.

*පළමු පාර්ශවය*

සහ

පර්ෂිප් සිනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක. 35,
එඩ්වඩ් පටුමඟ,
කොළඹ 03.

*දෙවැනි පාර්ශවය*

අතර පවතින කාර්මික ආරාවුල

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර ව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2016.12.05 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

### ආරවුලට තුඩුදුන් කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස පර්ෂිප් සිනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ වාප්පු විධායකයෙකු ලෙස සේවය කල ජේ. එස්. ඩබ්ලිව්. බුලත්සිංහල මහතාට සමාගම විසින් පැවරූ නිෂ්කාශන කාර්යය අංක (Job No) PS/SI/26/09/14/10094, PS/CL අංක 17345-3 දරන පෞද්ගලික බහාලුම් නිෂ්කාශනයේ දී ඔහු හරහා වැය කරන ලද මුදලින් රුපියල් තුන්දහස් නමසිය අනූ හත (රු. 3997/-) ක මුදලක් නොගෙවා සිටීම තුළින් හා එම සිද්ධියෙන් පසු ඔහු විසින් දරන තනතුර හා සමාන තනතුරුවල සේවය කරන සේවකයන් වෙත ලැබූ හිමිකම් සහ වරප්‍රසාද ලබා නොදී කටයුතු කිරීමෙන් අගතියක් සිදු වී ඇති බවට ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගතද? යුක්ති සහගත නම් ඔහුට හිමි සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

### පසුබිම

2017.02.21 වැනි දින ඉල්ලුම්කරු පැමිණිල්ලට අදාල විස්තර ප්‍රකාශය 2017.03.23 වැනි දින වගඋත්තරකාර පක්ෂය ඔවුන්ගේ විස්තර ප්‍රකාශය සමඟ R1 සිට R19 දක්වා ලේඛන ලකුණු කරන ලදී. 2017.05.07 වැනි දින ඉල්ලුම්කරු වගඋත්තරකරුගේ ප්‍රකාශයට පිලිතුරු සපයන ලදී.

මෙම විමසීමේදී ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්කරු පෞද්ගලිකවම සාක්ෂි ලබාදුන් අතර වගඋත්තරකරු වෙනුවෙන් කළමණාකාර සරත් ආනන්ද ප්‍රනාන්දු සහ සහකාර සමාන්‍යාධිකාරී දිමුතු මාවලගේ යන දෙදෙනා සාක්ෂි ඉදිරිපත් කරන ලදී. ඉල්ලුම්කරු A1 සිට A43 දක්වා ද වගඋත්තරකාර පක්ෂය R1 සිට R14 දක්වාද ලේඛන ලකුණු කරන ලදී.

2017.09.12 වැනි දින විමසීමට ගත් අවස්ථාවේදී දෙවන පාර්ශවය ලේඛකාධිකාරිවරයා ඉදිරියේදී දෙවන ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අවසරය ඉල්ලා සිටි අතර විමසීම 2017.10.17 වැනි දිනට නිම කරන ලදී. 2017.10.17 වැනි දින විමසීමට ගත් අවස්ථාවේදී ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටි නීතීඥ කුමාර වික්‍රමගේ මහතා මේ වන විටත් වගඋත්තරකාර පාර්ශවයේ දෙවන ප්‍රකාශය ලැබී නොමැති බවත් දන්වා සිටී.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නීතීඥ සාගර ජයවික්‍රම මහතා පිටපත් සමග ගොනු කළ බව දන්වා සිටියෙන් නඩු වාර්තා පරීක්ෂා කිරීමේදී ප්‍රමාද දෝෂයකින් උත්තර ප්‍රකාශය නියමිත අවස්ථාවේදී ගොනු කිරීමට නොහැකි වීම නිසා ඉල්ලුම්කරුවන්ට නඩු විභාගයට සූදානම් වීමට අවකාශයක් නොමැති බව පෙනී ගියෙන් දෙපාර්ශවයේ එකඟත්වය මත 2017.11.14 සහ 2017.12.06 වැනි දින පස්වරු 2.00ට විභාගයට සූදානම් වී පැමිණෙන ලෙස දන්වා සිටියෙමි.

2017.11.14 වැනි දින ඉල්ලුම්කරු මූලික සාක්ෂි දෙමින් A8 B දක්වා ලකුණු කලද වැඩිදුර මූලික සාක්ෂි සඳහා 2017.12.06 වැනි දිනට නියම කරන ලදී. වගඋත්තරකරුවන්ගේ ජ්‍යෙෂ්ඨ නීතීඥ සාගර ජයවික්‍රම මහතා අතිශය පෞද්ගලික හේතුවක් මත නොපැමිණි බවත් වෙනත් විභාග දිනයක් අයැදීමෙන් පසු 2018.01.10 සහ 2018.01.26 වැනි දින විභාගය සඳහා දින නියම කරන ලදී.

පැමිණිලිකරු දින ගණනාවක් මූලික සාක්ෂි දුන් අතර වගඋත්තරකාර පක්ෂය ද ඉල්ලුම්කරුගෙන් දින ගණනාවක් හරස් ප්‍රශ්න සඳහා දින ලබාගත් අතර ඉල්ලුම්කරු නැවත ප්‍රශ්න සඳහා ද දින ගණනාවක් ලබාගන්නා ලදී.

මෙම විමසීමේදී වඩාත් වැදගත් වන්නේ ඉල්ලුම්කරු හට රුපියල් තුන්දහස් නමසිය අනූ හත (රු. 3997/-) ක ගෙවීමක් ලබා නොදීම සහ එම සිද්ධියෙන් පසුව ඔහුගේ වෘත්තිමය අයිතිවාසිකම් සහ වරප්‍රසාද ලබා නොදීම සහ එමගින් අපහසුතාවයන්ට පත්කිරීමයි. දෙපාර්ශවය විසින් ම නඩු විභාගය සඳහා දීර්ඝ කාලයක් ලබා ගත් අතර ඇතැම් අවස්ථාවලදී අනවශ්‍ය ප්‍රශ්න හා තර්ක විතර්ක ද ඉදිරිපත් කරන ලදී. සමස්ථ නඩු විභාගය සලකා බැලීමේදී දෙපාර්ශවය අතර වැරදි වැටහීමක් ඇති වී තිබූ බවත් විශේෂයෙන්ම ඉල්ලුම්කරුගේ දරදඬු හා මුරණ්ඩු හැසිරීම් ස්වභාවය නිසා අදාල ප්‍රශ්නය දිග්ගැස්සුණු බව පෙනී යයි. ඉල්ලුම්කරු බොහෝ අවස්ථාවලදී කිවයුතු දේට වඩා නොකිය යුතු දේ ප්‍රකාශ කල ද ඔහු අසද්භාවයමය චේතනාවකින් ක්‍රියා කර බව නොපෙනේ.

වගඋත්තරකාර ආයතනය ද ඉල්ලුම්කරුගේ ක්‍රියාකලාපයට ප්‍රතිචාර දැක්වූ ආකාරය හිතුවක්කාරී ගති ස්වරූපයක් පෙන්නුම් කරයි. ඉල්ලුම්කරුව ඔහුට හිමි නිෂ්කාශණ කාර්යයයෙන් අයින් කලද වෙනත් මාර්ග වලින් ඔහුට අදායම් උපයා ගැනීමට ඉඩ සපයා දුන් බව සාක්ෂි විභාගයේදී මනාව පැහැදිලි වේ. විශේෂයෙන් ම,

1. ඉල්ලුම්කරුට වරායට ඇතුලු වීමේ බලපත්‍රය A (pass)
2. වාප්පු ලිපිකරු හැඳුනුම්පත්‍රය
3. රේගු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන CHA (Customs house agent) බලපත්‍රය ද ඉල්ලුම්කරුගෙන් ලබා ගන්නා ලදී.

මෙම නඩු විභාගයේදී ඉස්මතු වූ ප්‍රශ්නයක් වූයේ බහාලුම් නිෂ්කාශණයේදී නිල ගෙවීම් සහ නිල නොවන ගෙවීම් සඳහා වියදම් පිළිබඳ ක්‍රමවේදය සම්බන්ධවයි. වාණිජ බහාලුම් නිෂ්කාශණය කිරීමේදී දැරීමට සිදුවන නිශ්චිත ටැරිෆ් (Tarrif) එකක් හෙවත් ගෙවීම් ක්‍රම වේදයක් ලිඛිතව නොමැති බවත්ය. කළමණාකාර සරත් ආනන්ද

කියා සිටියේ පෞද්ගලික බහාලුම් නිෂ්කාශණ කටයුත්ත සංකීර්ණ හා ප්‍රශ්න සහගත බවත්ය. පෞද්ගලික බහාලුම් නිෂ්කාශණය කිරීමට නිශ්චිත ක්‍රමවේදයක් සකස් කරන ලෙස වාප්පු විධායක බුලත්සිංහල මහතා ඉල්ලා සිටිය ද එසේ සිදු නොවුන බව සාක්ෂි මගින් හෙළි විය. මෙම බේරුම්කරණයට අදාල වූ ඉල්ලුම්කරුගේ රුපියල් තුන්දහස් නමසිය අනූ හත (රු. 3997)ක මුදල සමාගමේ කාර්යයන් සඳහා යෙදූ මුදලක් බව 2020.06.29 වැනි දින සරත් ආනන්ද මහතා ඉතා පැහැදිලිවම පිළිගෙන ඇත.

එසේ කපා දැමූ රු. 4000/ බුලත්සිංහල විසින් සමාගමේ කාර්යයක් සඳහා වියදම් කරන ලද මුදලක් බව කළමණාකාර සරත් ආනන්ද මහතා පහත පරිදි පිළිගත්තේ ය.

ප්‍ර : ඒ කියන්නේ බුලත්සිංහල මහතා සමාගම වෙනුවෙන් වියදම් කළ රු. 4000/- තමා කපලා දාලා තියෙනවා නේද?

උ: ඔව්.

මෙම සිද්ධියෙන් පසුව බුලත්සිංහල මහතාට ස්ථාන මාරුවක් දෙන ලදී. එම ස්ථාන මාරුව අනුව කැලණියේ පිහිටි AAIPreport මෙම මාරුව සේවා අවශ්‍යතාවයන් අනුව ඉල්ලුම්කරුගේ පළපුරුද්ද අනුව සිදු කර නොමැති බවත් හුදෙක් ම ද්වේශ සහගත ලෙස පළිගැනීමේ චේතනාවෙන් කරන ලද්දක් බව ඉල්ලුම්කරුගේ ස්ථාවරය විය.

2020.06.29 වැනි දින කළමණාකාර සරත් ආනන්ද මහතා සිය සාක්ෂියේදී ඉතා පැහැදිලිවම වාප්පු විධායක බුලත්සිංහල මහතාගේ සේවා කාලය තුල කිසිම අවස්ථාවක ඔහු විෂමාචාරයක් කළ බවට අවවාද කිරීමක් පවා කළ නොමැති බවට ප්‍රකාශ කරන ලදී.

2019.12.18 වැනි දින සරත් ආනන්ද මහතා පහත සඳහන් ආකාරයට උත්තර දී ඇත.

ප්‍ර : මහත්තයා ඒ වගේම ඔය ස්ථාන මාරු කිරීමට පෙර බුලත්සිංහල මහත්තයාගේ සී. එච්. ඒ. එක 2015 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කිරීමේ ලේඛනයෙන් නම කපා හැරිය නේද?

උ: ඔව්.

ප්‍ර : මේ අධිකරණයේ කියා සිටියා ඔහුගේ නම කැපුවේ ඔහු බ්ලැක්ලිස්ට් කරලා තිබූ නිසා කියලා කිව්වා නේද?

උ: ඔව්.

ප්‍ර : සී. එච්. ඒ. වලට ඉල්ලුම්කරන අවස්ථාව වන විට ආයතනයේ බ්ලැක් ලිස්ට් වෙලා හිටිය සියළුම සේවකයින්ගේ නම් කපා හැරියාද?

උ: නැහැ.

ඉල්ලුම්කරු රුපියල් තුන්දහස් නමසිය අනූ හත (රු. 3997/) ක මුදල කළමණාකාරීත්වයෙන් ඉල්ලා සිටියද එය දිගින් දිගටම ප්‍රතික්ෂේප කරන ලද අතර මේ සම්බන්ධයෙන් මානව සම්පත් කළමණාකාරිනී වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලදී.

බේරුම්කරණයේදී සහකාර සාමාන්‍යාධිකාරී දිමුතු මාවලගේ ගරු අධිකරණයේ දී,

ප්‍ර : මම තමුන්ට යෝජනා කරනවා බුලත්සිංහල මහතා දිගින් දිගටම ඔහුට වියදම් වූ මුදල් පිළිබඳව තමුන්ට කිව්වා නේද?

උ: ඔව්.

ප්‍ර : තමුන්ලා දිගින් දිගටම රු. 3997/ ගෙවන්න කියන අවස්ථාවේදී බුලත්සිංහල මහතා ඉල්ලීමක් කලා නේද මේක ඔහුගේ වැටුපෙන් කපාගන්න?

උ: ඔව්.

ප්‍ර : ඊටපසු ඔහු ඉල්ලීමක් කලා මේක මට එක පාරටම දරාගන්න බැහැ. වාරික දෙකකින් මගේ වැටුපෙන් කපාගන්න කියලා.

උ: ඔව්.

කෙසේවෙතත් වගඋත්තරකාර ආයතනය ඉල්ලුම්කරුගෙන් රුපියල් තුන්දහස් නමසිය අනූ හත (රු. 3997/-)ක මුදල වැටුපෙන් පියවා ගැනීමට උත්සාහ නොකලා පමණක් නොව ආසන්නතම ඉහල නිලධාරියා වන සරත් ආනන්ද ප්‍රනාන්දු කිහිප වතාවක්ම පෞද්ගලිකවම ඔහු ගෙවන බවට වාචිකව ප්‍රකාශ කල තිබුනත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවත් පැහැදිලි වේ.

විශේෂයෙන්ම ඉල්ලුම්කරු විසින් ප්‍රකාශ කරන ලද සත්‍ය වියදම සහ සාවද්‍ය වියදම අතර වෙනස A5 දරන ලේඛනයෙන් දක්වා තිබීම සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර විවාදාත්මක තත්ත්වයක් උද්ගත විය. එකී අර්ථ නිරූපනයේදී රු. 3997/-ක මුදල සාවද්‍ය වියදමක් ලෙස හුවා දැක්වීමට වගඋත්තරකාර පක්ෂය උත්සාහ කර ඇත. නමුත් ඉල්ලුම්කරු එම ප්‍රකාශය කලේ ඉල්ලුම්කරුගේ ක්‍රියාව නිසා වගඋත්තරකාර ආයතනයට වැඩිපුර රු. 3997/ක මුදලක් ලැබෙන බව කියා පෑමටයි. එය ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටින සාවද්‍ය වියදමක් නොව ඔහුගේ ක්‍රියාව නිසා වගඋත්තරකාර ආයතනයට ලැබෙන සාවද්‍ය ආදායමක් ලෙස පැහැදිලි කර ගත යුතුව ඇත.

ඉල්ලුම්කරු බේරුම්කරණයේදී හැසිරුණු විලාසය සහ සමාගම සමඟ කටයුතු කිරීමේදී දෙපාර්ශවය අතර අනවබෝධය නිසා යම් යම් ප්‍රතිවිරුද්ධ මතවාදයන් ඇති වී තිබුණු බවට නිගමනය කිරීම වඩාත් යෝග්‍යයැයි මම සිතමි. ඉල්ලුම්කරු තමන්ගේ උසස් නිලධාරීන්ට චේතනාත්වකම අපහාස කිරීමට හෝ හෑල්ලු කිරීමට උත්සහ නොකල බව පෙනී යන්නේ සත්‍ය ලෙසම ඉල්ලුම්කරුට පෞද්ගලිකව නිෂ්කාශණ සම්බන්ධයෙන් මනා පරිචයක් නොතිබූ බව අවධාරණය කළ නිසාය. මෙම තත්වය ඉල්ලුම්කරුගේ ආසන්නතම ප්‍රධානියා වන කළමනාකාර සරත් ආනන්ද මහතාගේ ප්‍රකාශ තුලින් මනාව පැහැදිලි වේ.

වගඋත්තරකාර පාර්ශවයේ බහාලුම් නිෂ්කාශණ සම්බන්ධයෙන් ක්‍රියාකාරීත්වය සළකා බැලීමේදී පැහැදිලි නිශ්චිත ක්‍රමයක් නොතිබූ බවත් යම් යම් අවස්ථාවන්හිදී තමන්ගේ පෞද්ගලික තීරණය මත ක්‍රියාත්මක වූ බවත් පැහැදිලි වේ.

කළමණාකාර සරත් ආනන්ද මහතාම ඉතා පැහැදිලිවම 2020.06.29 වැනි දින සාක්ෂි සටහනේදී තමා සමාගම වෙනුවෙන් වියදම් කල රුපියල් 4000/- කපා දැමූ බව එකහෙළාම පිළිගෙන ඇත.

සහකාර සාමාන්‍යාධිකාරි දිමුතු මාවල, බුලත් සිංහල සහ සරත් ආනන්ද මහතා සමඟ ජනේස් රත්නදාස මහතා හමුවූ බවත් එහිදී මේ ගෙවීමෙන් පසුව ටැරිෆ් එකක් හදන්න කියලා උපදෙස් දුන් පසු ටැරිෆ් එක හදන්න කිව්වාම එය ප්‍රතික්ෂේප කල බව සාක්ෂි වලදී හෙළිදරව් විය. බුලත්සිංහල මහතා ආනන්ද මහතාට අභියාචනයක් යොමු කල අතර මානව සම්පත් කළමනාකාරිය වෙත ද අභියාචනා යොමු කළ බව ඉතා පැහැදිලිව පෙණුනි.

ප්‍රදානයඃ -

දෙපාර්ශවයෙන් ම ඉදිරිපත් කරන ලද සමස්ථ කරුණු අධ්‍යයනය කිරීමේදී ලකුණු කරන ලද ලේඛණ සලකා බැලීමේදී ඉදිරිපත් කරන ලද ලිඛිත සැලකිරීම් විමර්ශනය කිරීමේදී පැහැදිලි වන්නේ නොසලකා හැරිය යුතු ප්‍රශ්නයක් දෙපාර්ශවය විසින්ම වසර ගණනාවක් අනවශ්‍ය ලෙස ඇදගෙන යාමෙන් දෙපාර්ශවයට දොස් පවරා ගනිමින් කරන ලද අනවශ්‍ය ක්‍රියාකාරකමක් ලෙසයි. සම්පූර්ණ නඩු වාර්තාව සලකා බැලීමේදී ඉල්ලුම්කරු ක්‍රියා කර ඇති ආකාරය දෝෂ සහගත නොවන බවත් වගඋත්තරකාර පාර්ශවය ඉල්ලුම්කරුගේ ක්‍රියාවන්ට ප්‍රතිචාර දැක්වීමේදී ස්වභාවික යුක්තියේ මූලධර්ම මෙන්ම සදාචාරමය ප්‍රතිපත්තිමද නොසලකා හරිමින් ඉල්ලුම්කරුට බලවත් චිත්ත පීඩාවක් මානසික ආතතියත් ඇති කර ඇති බව පැහැදිලි වේ. ඉල්ලුම්කරු

1. වරායට ඇතුලු වීමේ බලපත්‍රය A (pass)
2. වාප්පු ලිපිකරු හැඳුනුම්පත්‍රය
3. රේගු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන CHA (Customs house agent) බලපත්‍රය ලබා ගැනීම

ඉල්ලුම්කරු කැලණිය AAIPreport ආයතනයට මාරු කර හැරීම, ඉල්ලුම්කරුගේ සේවා කාණ්ඩයට අයත් වන අන්‍ය සේවකයන්ට හිමි අයිතිවාසිකම් හා වරප්‍රසාද ලබා නොදීම වැනි කරුණු වලින් පෙනී යන්නේ වගඋත්තරකාර ආයතනය ඉල්ලුම්කරුව අනුමිත සහගත ලෙස සේවයෙන් පහ කර ඇති බවයි.

මේ කරුණු සියල්ල සැලකිල්ලට ගෙන ඉල්ලුම්කරුගේ ඉල්ලීමට අනුව,

1. ඔහුට හිමි සියලුම වැටුප් ලබාදෙමි.
2. අහිමි කරන ලද සියලුම අයිතිවාසිකම් නැවත ලබාදෙමි.
3. වසර 25ක පළපුරුද්ද ඇති ඉල්ලුම්කරුට සේවය අහිමි කිරීම සම්බන්ධයෙන් රුපියල් ලක්ෂ විසි පහ (රු. 2,500,000/-)ක වන්දි මුදලක් ලබාදෙමි.
4. නඩු ගාස්තු වශයෙන් රුපියල් එක්ලක්ෂ හැත්තෑපන්දහස (රු.175,000/-) ක මුදලක් ප්‍රදානය කරමි.

**මෙම ප්‍රදානයන් ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට මසක් ඇතුළත මෙහි පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරු වන ජේ. එස්. ඩබ්ලිව්. බුලත්සිංහල මහතාට ඉහතින් දැක්වූ ගෙවීමට අදාල මුදල් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතුය.**

පැමිණිලි පක්ෂය විසින් ඉල්ලීමට අදාලව ඉදිරිපත් කළ කරුණු අනුව පැහැදිලි වන්නේ ඉල්ලුම්කරුගේ ආයාචනය පරිදි ඉල්ලීම් ලබාදීම සාධාරණ හා යුක්ති සහගත බවයි.

සටහන

මෙම නඩුව දීර්ඝ කාලයක් තුල විමසීමට ලක් වූ නඩුවක් වන අතර සාමාන්‍යයෙන් සිව් වසරක කාලයක් පමණ ගත වී ඇත. පැමිණිලි පක්ෂයේ එනම්, සාක්ෂිකරු වූයේ ඉල්ලුම්කරු වුවද ඔහුගේ මූලික සාක්ෂිය දින පහක් පමණ ද හරස් ප්‍රශ්න සඳහා දින 3ක් පමණ ද නැවත ප්‍රශ්න සඳහා දින දෙකක් ද ගත වී තිබුණි. වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් ආයතනයේ නිෂ්කාශණ අංශයේ කළමනාකරු සහ සහකාර සාමාන්‍යාධිකාරිවරයාද සාක්ෂි දුන් අතර ඒ සඳහා ද දින පහකට වැඩි කාලයක් ගත වූ බව පෙනේ. නඩු විභාගයෙන් පසුව ප්‍රදානය ඉදිරිපත් කිරීමට පමා වූයේ රටේ පවතින Covid 19 වසංගත තත්ත්වය හේතු කොටගෙන බව දක්වමි.

**එස්. එම්. එස්. ජයවර්ධන,**
බේරුම්කරු,

2021.10.11 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.